T1 copy

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අ.පො.ස.(සා/පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2023 (2024)
க.பொ.த. (சா/த) முன்மாதிரிப் பரீட்சை 2023 (2024)
G.C.E. (O/L) Practice Test - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade: 11

# ඉතිහාසය - 1

33 S I

කාලය / நேரம் / Time: පැය එකයි

උපදෙස්:-
- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80 ක් හිමි වේ.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුල (X) ලකුණ යොදන්න.

22348

01. ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳව අඛණ්ඩව ලියවී ඇති සාහිත්‍ය මූලාශ්‍රය වන්නේ;
(1) දීපවංශය (2) බෝධිවංශය (3) මහාවංශය (4) පූජාවලිය

02. ගල්ලෙන් වල කටාරම් අසල ලියා ඇති අභිලේඛන හඳුන්වනු ලබන්නේ කිනම් නමකින් ද?
(1) ගිරිලිපි (2) ලෙන්ලිපි (3) ටැම්ලිපි (4) පුවරුලිපි

03. ශ්‍රී ලංකාව ගැන තොරතුරු සැපයූ විදේශ ලේඛකයන් කිහිපදෙනෙකු I තීරුවේ ද, ඔවුන් අයත් වූ රටවල් II තීරුවේ ද දැක්වේ. I තීරුව II තීරුව හා ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේමින් කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1) ඉබන් බතුතා | A - අරාබි |
| 2) ෆාහියන් | B - ග්‍රීක |
| 3) මෙගස්තිනීස් | C - බුරුම |
| | D - චීන |

(1) AD හා B (2) CD හා A (3) AC හා B (4) DA හා B

04. ප්‍රාග් ඓතිහාසික මානවයන් වාසය කළේ යැයි සැලකෙන පහතරට වියළි කලාපීය එළිමහන් කඳවුරක් වන්නේ;
(1) මිනිහාගල්කන්ද (2) බූන්දල (3) පතිරාජවෙල (4) පොතාන

05. දානය සපයා ගැනීමේ කටයුතුවල දී යම් ගැටලුවක් ඇති වුවහොත් දසගම් ඇත්තන් රැස් වී එම ගැටලුව විසඳිය යුතු බව දැක්වෙන්නේ;
(1) ඇඹුල් අඹේ සෙල්ලිපිය
(2) කළුදියපොකුණ සෙල්ලිපිය
(3) බුද්ධන්නෙහෙල සෙල්ලිපිය
(4) වේවැල්කැටිය සෙල්ලිපිය

06. නායක ස්වාමීන්වහන්සේලා යටතේ වැඩ වාසය කළ භික්ෂූන් වහන්සේලා හඳුන්වන ලද්දේ;
(1) සද්ධිහරිය (2) භාණකවරු (3) අන්තේවාසික (4) ථෙර

07. I තීරුවේ පැරණි සමාජයේ පැවති වෘත්තීන් ද II තීරුවේ ඒවා වර්තමානයේ හඳුන්වන ආකාරය ද දැක් වේ. I තීරුවේ අනුපිළිවෙල අනුව II තීරුව ගැලපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1) වෙජ | A - ව්‍යාපාරිකයා |
| 2) වොහර | B - වෛද්‍යවරයා |
| 3) ලපන | C - චිත්‍ර ශිල්පියා |
| | D - නීතිඥවරයා |

(1) BD හා C (2) AC හා D (3) BC හා D (4) AB හා D

08. පැරණි සමාජයේ රාජ්‍ය පරිපාලනය සැකැස්මේ දී නගර පරිපාලක තනතුර හඳුන්වා ඇති නම කුමක් ද?
(1) නගරගුතික (2) නගරඩුඩික (3) නටඅදෙක (4) රූපඅදෙක

09. දකුණු ඉන්දියාවේ ක්‍රිෂ්ණ ගංගා නිම්නයේ ඇති වූ ආහාර හිඟයක් හේතුවෙන් මෙරට නිපදවන ධාන්‍ය සඳහා විශාල ඉල්ලුමක් ඇතිවූයේ
(1) I වන පරාක්‍රමබාහු රජතුමා
(2) වසභ රජතුමා
(3) නිශ්ශංකමල්ල රජතුමා
(4) මහසෙන් රජතුමා

10. පුරාණ යකඩ නිස්සාරණ තාක්ෂණය භාවිතයේ දී උඳුන් දැල්වීම සඳහා ස්වාභාවික සුළං බලය භාවිත කර ඇත්තේ;
(1) බලංගොඩ සමනලවැව ප්‍රදේශයේ
(2) දෙහිගහ ඇල කන්ද
(3) අනුරාධපුරයට නුදුරු ඉසුරුමුණිය ප්‍රදේශයේ
(4) පොළොන්නරුව ආලාහන පිරිවෙන

11. කෑගල්ල දිස්ත්‍රික්කයේ දැදිගම සූතිඝර චෛත්‍ය ඉදිකර ඇත්තේ කිනම් රජ කෙනෙකුගේ උත්පත්තිය සිහිවීම සඳහා ද?
(1) I වන පරාක්‍රමබාහු රජතුමා
(2) II වන පරාක්‍රබාහු රජතුමා
(3) VI වන පරාක්‍රමබාහු රජතුමා
(4) III වන පරාක්‍රබාහු රජතුමා

12. වැවේ විශාල ජල ධාරාවක් රඳවා ගැනීම සඳහා ඉදිකර ඇති අංගය වන්නේ;
(1) වැව් බැම්ම (2) සොරොව්ව (3) බිසෝකොටුව (4) දියකැටපහන

13. ''වල් වල දඬුපත් නොකපනු ඉසා'' යනුවෙන් සඳහන් වන සෙල්ලිපිය කුමක් ද?
(1) අනුරාධපුර පුවරු ලිපිය
(2) කොණ්ඩවට්ටවාන් ටැම් ලිපිය
(3) සොරබොරවැව ටැම් ලිපිය
(4) බුද්ධන්නෙහෙල සෙල්ලිපිය

14. වැව් හා ඉඩම් පරිපාලනය සම්බන්ධ සෙල්ලිපිවල සඳහන් නීති I වන තීරුවේ ද එක් එක් කොටස් පිළිබඳ පැහැදිලි කිරීම II වන තීරුවේ ද දක්වා ඇත. I තීරුව අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
| --- | --- |
| 1) දකපති | A - රජුට අයත් ඉඩම්වල වගා කිරීම වෙනුවෙන් ගෙවන ලද බද්ද |
| 2) බොජක පති | B - වැව්වල ජලය භාවිත කරන්නන්ගෙන් අය කළ බද්ද |
| 3) මතරමපිබක | C - රජු සහ රජවාසල ප්‍රයෝජනය සඳහා වෙන් වූ ඉඩම් වෙනුවෙන් ගෙවන ලද බද්ද |
| | D - ඇල මාර්ග වල මත්ස්‍යයන් ඇල්ලීම වෙනුවෙන් රජය අයකළ බද්ද |

(1) ABC (2) CAB (3) ABD (4) DCB

15. මයුපාද පිරිවෙන්පති බුද්ධපුත්‍ර හිමියන් දඹදෙණිය යුගයේ දී ලියූ ග්‍රන්ථයක් වන්නේ;
(1) පූජාවලිය (2) කාව්‍යශේඛරය (3) දළදා සිරිත (4) කව්සිළුමිණ

16. 13 වන සියවසේ සිට 15 වන සියවස අවසානය දක්වා කාලය තුළ ශ්‍රී ලංකා ඉතිහාසයේ කැපීපෙනෙන ලක්ෂණ අතුරෙන් සාවද්‍ය ලක්ෂණය වන්නේ කුමක් ද?
(1) සිංහල පාලකයින් ආරක්ෂිත ස්ථාන තම පාලන මධ්‍යස්ථාන ලෙස තෝරා ගැනීම
(2) කෘෂි කර්මාන්තයට තිබූ අනුග්‍රහය ක්‍රමයෙන් හීන වී යාම
(3) ජාවක, පාණ්ඩ්‍ය හා චීන වැනි විදේශීය ආක්‍රමණ වරින් වර එල්ල වීම
(4) යුරෝපීන් මුහුදු බඩ ප්‍රදේශ තම ආධිපත්‍ය යටතට ගැනීම

17. පුනරුද සමයේ දී මිනිස් සිරුරේ රුධිර සංසරණ පද්ධතිය පිළිබඳව වැදගත් තොරතුරු සොයාගන්නා ලද්දේ;
(1) ස්විස් ජාතික වෛද්‍ය පැරසල්සස්
(2) ස්විස් ජාතික මයිකල් සර්ටෙස්
(3) ජොහැන්ස් ගුටෙන්බර්ග්
(4) ඉංග්‍රීසි ජාතික විලියම් හාවේ

18. කෝට්ටේ පාලක හයවන විජයබාහු රජුට සමකාලීන උඩරට පාලකයා;
(1) සේනාසම්මත වික්‍රමබාහු
(2) ජයවීර බණ්ඩාර
(3) කරලියද්දේ බණ්ඩාර
(4) වීරසුන්දර බණ්ඩාර

19. 1619 දී යාපනය යටත් කරගත් පෘතුගීසි ජාතික සෙන්පතිවරයා කවුරුන් ද?
(1) කොන්ස්තන්ති නු ද සා
(2) පිලිප් ද ඔලිවේරා
(3) දියෝගෝ ද මෙලෝ
(4) දොන් ජෙරනිමෝ ද අසවේදු

20. I වන විමලධර්මසූරිය රජු උඩරට සිය නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීමට ගත් පියවරක් නොවන්නේ;
(1) කුසුමාසන දේවිය විවාහ කරගැනීම
(2) රෝමානු කතෝලික ආගම අතහැර බුදුදහම වැළඳ ගැනීම
(3) දන්තුරේ සටනේ දී පෘතුගීසීන් අන්ත පරාජයකට පත් කිරීම
(4) විමලධර්මසූරිය නමින්බෞද්ධ නමක් ලබා ගැනීම

21. පේෂ කර්මාන්තයේ දී වඩාත් සියුම්ව හා ශක්තිමත් ලෙස නූල් සකසා ගැනීම සඳහා භාවිත කළ මියුල් යන්ත්‍රය නිපදවූයේ;
(1) ජේම්ස් හාග්‍රීව්ස් (2) රිචඩ් ආක්රයිට් (3) සැමුවෙල් ක්‍රොම්ප්ටන් (4) ජේම්ස් වොට්

22. කාර්මික විප්ලව සමයේ සිදුවූ දේශපාලන වෙනස්වීම් අතුරෙන් රාජ්‍ය නිර්බාධවාදය යනු;
(1) රාජ්‍යයේ මැදිහත් විම උපරිම වීම
(2) ජනතාවගේ මැදිහත්වීම අවම වීම
(3) ජනතාවගේ පරමාධිපත්‍ය බලය තහවුරු වීම
(4) රජයේ මැදිහත්වීම අවම වීම

23. ප්‍රංශ ජාතිකයන් ඉන්දියාවේ පිහිට වූ වෙළඳ මධ්‍යස්ථානයක් වන්නේ;
(1) මදුරාසිය (2) චන්ද්‍රනගර් (3) බොම්බාය (4) කල්කටාව

24. 1848 නිදහස් සටන පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ;
(1) සටනේ ප්‍රධාන මධ්‍යස්ථානය වූයේ මාතලේ ප්‍රදේශයයි
(2) සටන මෙහෙයවන ලද්දේ කැප්පෙටිපොල දිසාවේ විසිනි
(3) සටනෙහි ප්‍රතිඵලයක් ලෙස මඩුගල්ලේ දිසාවේ මරණයට පත්විය
(4) සටනේ ප්‍රධාන මධ්‍යස්ථාන වූයේ මහනුවර හා කුරුණෑගල ප්‍රදේශයයි

25. ගාල්ලේ ලංකෝපකාර මුද්‍රණාලය පිහිට වූයේ;
(1) වලානේ සිද්ධාර්ථ හිමි
(2) බුලත්ගම ධම්මාලංකාර සිරි සුමනතිස්ස හිමි
(3) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි
(4) රත්මලානේ ධම්මාලෝක හිමි

26. බෞද්ධාගමික පුනරුදය සඳහා හෙන්රි ස්ටීල් ඕල්කට්තුමාගෙන් සිදු වූ සේවාවන් වන්නේ;
(1) මහාබෝධි සඟරාවට ලිපි සැපයීම
(2) මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන පිහිටුවීම
(3) අනුරාධපුර පූජනීය ස්ථාන රැකගැනීමේ ව්‍යාපාරය ආරම්භ කිරීම
(4) කොළඹ පරම විඥානාර්ථ සමාගම පිහිටුවීම

27. කෲව් මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ;
(1) උගත් ලාංකිකයන් වෙනුවෙන් එක් නියෝජිතයෙකු ව්‍යවස්ථාදායක සභාවට තේරී පත්වීම
(2) අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම
(3) පළාත්බද නියෝජන ක්‍රමය හඳුන්වා දීම
(4) ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම

28. ලංකා ජාතික සංගමයේ පළමු සභාපතිවරයා වන්නේ;
(1) පොන්නම්බලම් රාමනාදන්
(2) පොන්නම්බලම් අරුණාචලම්
(3) ටී. බී. ජයතිලක
(4) ජේම්ස් පීරිස්

29. කෝල්බෲක් කොමිසමේ ආර්ථික ප්‍රතිසංස්කරණයක් නොවන්නේ;
(1) රජයේ ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තිය
(2) කුරුඳු හා ලුණු ඒකාධිකාරිය අහෝසි කිරීම
(3) අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය ක්‍රියාත්මක කිරීම
(4) ඉඩම් අහිමි ජනතාවක් බිහිවීම

30. බ්‍රිතාන්‍ය පාලනය නිසා රටට හිමි වූ අහිතකර අංගයක් වන්නේ;
(1) අපනයන වැවිලි බෝග හඳුන්වා දීම
(2) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය
(3) කාර්මික විප්ලවයේ බලපෑම මෙරටට ලැබීම
(4) ඉඩම් අහිමි ජනතාවක් බිහිවීම

31. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උත්තරීතර හා අවසාන අධිකරණ බලය හිමිවූයේ;
(1) ශ්‍රේෂ්ඨාධිකරණය (2) අභියාචනාධිකරණය (3) මහේස්ත්‍රාත් අධිකරණය (4) මහාධිකරණය

32. නිදහස ලැබීමෙන් පසු පිහිට වූ ගොවි ජනපදයක් වන්නේ කුමක් ද?
(1) මින්නේරිය (2) මීනිපේ (3) කන්තලේ (4) පරාක්‍රම සමුද්‍රය

33. මධ්‍යතන යුගයේ දී යුරෝපයේ ඇරඹි පුනරුදය නිසා විවිධ ක්ෂේත්‍රවල බොහෝ වෙනස්කම් සිදු විය. ලියනාඩෝ ඩාවින්චි ප්‍රසිද්ධියට පත්වූයේ මින් කවර ක්ෂේත්‍රයක ද?
(1) වෛද්‍ය විද්‍යාව (2) චිත්‍ර කලාව (3) දේශ ගවේෂණය (4) සාහිත්‍ය

- පහත දැක්වෙන කරුණු ඇසුරෙන් 34 සහ 35 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**A - සාර් පාලනය බිඳවැටීම**
**B - පිලඩෙල්පියා සම්මේලනය**
**C - නැපෝලියන් බොනපාට් බලයට පත්වීම**
**S - කෙරෙන්ස්කි නම් නායකයා බලයට පත්වීම**
**E - ලෝකයේ ප්‍රථම ලිඛිත සන්ධීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් බිහිවීම**

34. ඇමරිකන් විප්ලවය හා සම්බන්ධ පිළිතුර වන්නේ;
(1) B හා E (2) A හා C (3) C හා E (4) B හා D

35. 1917 මාර්තු විප්ලවයේ ප්‍රතිඵල ඇතුළත් යුගලය කුමක් ද?
(1) A හා C (2) B හා E (3) A හා D (4) C හා D

- **පහත A හා B ඇසුරෙන් 36 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.**

**A - සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වාදීම**
**B - ශ්‍රී ලංකාව ඒකීය ජනරජයක් බව පිළිගැනීම**

36. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන්;
(1) A හා B සත්‍ය වේ (3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ
(2) A හා B අසත්‍ය වේ (4) B අසත්‍ය වන අතර සත්‍ය වේ

37. ගල්ෆ් අර්බුදයේ දී ඉරාකය විසින් ආක්‍රමණය කළ රට වන්නේ;
(1) කුවේටය (2) ඉරානය (3) තුර්කිය (4) ඇෆ්ගනිස්ථානය

- පහත A, B, C හා D යටතේ දක්වා ඇති එක් එක් යුගලයන් හි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාව පරීක්ෂාකර බලා අංක 38 සිට 40 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - 1 ජපානයේ හිරෝෂිමාවට බෝම්බ හෙලීම
- 2 ජපානය කොන්දේසි විරහිතව යටත් වීම

B - 1 ජාතීන්ගේ සංගමය
- 2 දෙවන ලෝකමහා සංග්‍රාමය ඇතිවීම

C - 1 එක්සත් ජාතීන්ගේ සංවිධානය
- 2 ආර්ථික සම්බාදක පැනවීම

D - 1 ප්‍රාන්ස් ෆර්ඩිනන්ඩ් කුමරු ඝාතනය
- 2 හිට්ලර් පෝලන්තය ආක්‍රමණය කිරීම

38. පළමුවැන්න හේතු කොටගෙන දෙවැන්න ඇතිවීම
(1) A (2) B (3) C (4) D

39. පළමුවැන්න අසාර්ථක වීම නිසා දෙවැන්න ඇතිවීම
(1) A (2) B (3) C (4) D

40. පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවයක් නොමැති යුගලය
(1) A (2) B (3) C (4) D

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අ.පො.ස.(සා/පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2023 (2024)
க.பொ.த. (சா/த) முன்மாதிரிப் பரீட்சை 2023 (2024)
G.C.E. (O/L) Practice Test - 2023 (2024)

22378

| ශ්‍රේණිය / தரம் / Grade | 11 |
|---|---|
| කාලය / நேரம் / Time | පැය තුනයි |

# ඉතිහාසය - II

| 33 | S | II |
|---|---|---|

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

- උපදෙස්:-
  - I කොටසේ ප්‍රශ්න අංක 1 අනිවාර්යය වේ.
  - II කොටසින් ප්‍රශ්න හතරකට ද, iii කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
  - පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන හයකි.

## I කොටස

01. (අ) i. පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

නල්ලූර්, හලාවත, නාච්චාදූව වැව, දැදුරු ඔය, ත්‍රිකුණාමලය, කැළණිය, දෙවිනුවර, මිණිපේ අමුණ, ලංකාපටුන, පොලොන්නරුව, ඉබ්බන්කටුව, වික්ටෝරියා ජලාශය (ලකුණු 12 යි)

ii. පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.

රෝමය, පර්සියන් බොක්ක, කැලිකට්, මලක්කා සමුද්‍ර සන්ධිය, නාගසාකි, වැනීසිය (ලකුණු 06 යි)

(ආ) i. පහත A, B, C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුර අනුපිළිවෙලින් ඔබේ පිළිතුර පත්‍රයේ ලියා දක්වන්න.

A - නාගදීපය පාලනය කළ සෑෂිගිරි නම් ඇමතිවරයා විසින් ඉදිකළ විහාරය කුමක් ද?
B - ඉන්දියාවේ කැලිකට් වරායට ගොඩබට පළමු පෘතුගීසි යාත්‍රිකයා කවරෙක් ද?
C - පළමු ලෝක මහා සංග්‍රාමයෙන් පසු බටහිර රටවල් මැදිහත් වීමෙන් ජර්මනියේ පිහිට වූ නව ආණ්ඩුව කුමක්ද?
D - රුසියානු බෝල්ෂේවික් වරුන්ගේ නායකයා කවුරුන් ද? (ලකුණු 04 යි)

- A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

ii. 1. A අක්ෂරයෙන් දැක්වෙන්නේ කුමක් ද?
2. මෙය සොයාගන්නාලද්දේ කුමන ස්ථානයකින් ද?
3. මෙය භාවිත කර ඇත්තේ කුමක් සඳහා ද?
4. මෙය අයත්වන ඓතිහාසික යුගය නම් කරන්න.
(ලකුණු 04 යි)



A



දෙවැනි පිටුව බලන්න

iii. 1. B රූපයෙන් දැක්වෙන පුද්ගලයා නම් කරන්න.
2. මෙතුමා අගමැති ධුරය දැරූයේ කුමන රටක ද?
3. මොහු විසින් යුධ පෙරමුණක් ගොඩනගා ගත්තේ කිනම් රටකට විරුද්ධව ද?
4. මොහු හා ඇමෙරිකානු ජනාධිපති අතර 1941 අගෝස්තු මස අත්සන් කළ ප්‍රඥප්තිය කුමක් ද?

(ලකුණු 04 යි)



B

## II කොටස

02. i. දේශීය සාහිත්‍ය මූලාශ්‍රය **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

ii. ඉතිහාසය ගොඩනැගීමට සාහිත්‍ය මූලාශ්‍රය යොදා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

iii. ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයාගේ ජීවන රටාව කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

iv. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යූහය හා ස්වරූපය කරුණු **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

03. i. අතීත ශ්‍රී ලංකාවේ රජවරු භාවිත කළ රාජ්‍යත්ව සංකල්ප කිහිපයක් පහත දැක් වේ. ඒවා භාවිත කළ රජවරුන් කවුරුන්දැ යි දක්වන්න.

A - නරේශ්වර
B - දේවත්ව
C - පර්වතරාජ

(ලකුණු 03 යි)

ii. ගමික සතු කාර්යයන් **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

iii. පළමුවන විජයබාහු රජතුමා රටේ සමස්ථ භූමිය පැවැත්ම ආරක්ෂා කර ගැනිම උදෙසා අනුගමනය කළ ක්‍රියාමාර්ග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

iv. දුටුගැමුණු රජතුමාගේ ආගමික සේවා **එකක්** හා දේශපාලන සේවාවන් **දෙකක්** නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

04. i. පහත ප්‍රකාශ සම්බන්ධයෙන් ගැළපෙන පිළිතුරු සපයන්න.

A - වෙර යොදා බලයක් යෙදීමෙන් ගල්පතුරු ගලවා මෙවලම් තැනීම
B - මයිනහම භාවිතයෙන් යකඩ නිස්සාරණය කළ උඳුන පිහිටි ප්‍රදේශය
C - ස්ථිතික ජල විද්‍යා මූලධර්මය යොදා ගැනීම

(ලකුණු 03 යි)

ii. සනීපාරක්ෂාව, ස්වස්ථතාව හා වෛද්‍ය ක්‍රම සම්බන්ධයෙන් අතීත රජවරුන්ගෙන් ඉටු වූ සේවාවන් **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

iii. මැටි ඔරු සුසාන තැනීමට භාවිත කළ තාක්ෂණික ක්‍රම **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

iv. වැවක ආරක්ෂාව සඳහා ඉදිකර තිබෙන ප්‍රධාන අංග **තුනක්** දක්වා ඒවායින් වැවේ ආරක්ෂාවට සැලසෙන සේවාවන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

05. i. මහනුවර රාජධානි සමයේ රජතුමා විසින් විසඳන ලද නඩු වර්ග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

ii. උඩරට රාජධානි සමයේ වැරදි කළ පුද්ගලයින් සඳහා ලබාදුන් දඬුවම් වර්ග **හතරක්** ලියා දක්වන්න. (ලකුණු 04 යි)

iii. පළමුවන විමලධර්මසූරිය රජතුමා රාජ්‍යත්වයට පත්වීමේ දී මුහුණ දුන් අභියෝග **දෙකක්** දක්වා, ඒවා ජය ගැනීමට ක්‍රියා කළ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

iv. මහනුවර රාජධානි සමයේ සමාජ සංවිධානය තුළ දක්නට ලැබෙන ලක්ෂණ **තුනක්** නම් කර ඒවා සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 06 යි)



තුන්වෙනි පිටුව බලන්න

06. i. කාලිංග මාඝ ආක්‍රමණයෙන් පසුව ස්වදේශීය නායකයන් ආරක්ෂිත ස්ථානවල පිහිටුවාගත් පාලන මධ්‍යස්ථාන **තුනක්** නම් කරන්න.
(ලකුණු 03 යි)

ii. පහත A සිට D දක්වා ඇති සිද්ධිය හා සම්බන්ධ රජවරු කවුරුන්දැයි වරහන් තුළින් තෝරා ලියන්න.

A - අනුරාධපුර රාජධානියේ අවසන් පාලකයා
B - රෝමයට තානාපතිවරුන් යැවීම
C - යාපන රාජධානියේ ආරම්භක පාලකයා
D - බෙලිගල දළදා මැදුරක් ඉදිකිරීම

(පස්වන මිහිඳු, වරෝදය, භාතිකාභය, හතරවන උදය, විජය කුලංකෙ, තුන්වන විජයබාහු, දෙවන පරාක්‍රමබාහු, හතරවන අග්‍රබෝධි)
(ලකුණු 04 යි)

iii. පොළොන්නරු රාජධානිය බිඳවැටීමට තුඩුදුන් හේතු **දෙකක්** දක්වා කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 05 යි)

iv. දඹදෙණි යුගයේ දෙවන පරාක්‍රමබාහු රජතුමා දේශපාලනික වශයෙන් අභියෝග ජයගත් ආකාරය පැහැදිලි කරන්න.
(ලකුණු 06 යි)

07. i. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගින් හඳුන්වා දුන් අංග **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

ii. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ හඳුන්වාදුන් පාර්ලිමේන්තුව සතු බලතල **දෙකක්** සඳහන් කරන්න.
(ලකුණු 04 යි)

iii. ගොවිජනපද පිහිටුවීමේ අරමුණු **දෙකක්** සඳහන් කර ඒවා සැකවින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

iv. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය මගින් අපේක්ෂා කළ අරමුණු **තුනක්** සඳහන් කර කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 06 යි)

## III කොටස

08. i. පහත සඳහන් ප්‍රකාශ සමග සම්බන්ධ පුද්ගලයින් නම් කරන්න.

A - ගුරුත්වාකර්ෂණ නියමය
B - ග්‍රහලෝක සූර්යයා වටා ඉලිප්සාකාරව ගමන් ගන්නා බව
C - මුද්‍රණ යන්ත්‍රය නිපදවීම
(ලකුණු 03 යි)

ii. යුරෝපා ජාතීන් නව මුහුදු මාර්ග සොයා යෑමට පෙළඹීමට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න.
(ලකුණු 04 යි)

iii. පුනරුදය ඇතිවීමට බලපෑ හේතු **දෙකක්** සඳහන්කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

iv. යුරෝපයේ ඇතිවූ පුනරුදය ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ වෙනස් වීම කෙරෙහි බලපෑ ආකාරය කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න.
(ලකුණු 06 යි)

09. i. පහත සඳහන් නව නිපැයුම් සිදුකළ පුද්ගලයින් කවුරුන්දැයි පිළිවෙලින් නම් කරන්න.

A - දුම්රිය එන්ජිම
B - මොටර් රථය
C - වාෂ්ප එන්ජිම
(ලකුණු 03 යි)

ii. කාර්මික විප්ලවය ඇතිවීමට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

iii. කාර්මික විප්ලවයේ ව්‍යාප්තිය ප්‍රවාහන හා සන්නිවේදනයන් ක්ෂේත්‍ර ඔස්සේ කරුණු **දෙකක්** මගින් විස්තර කරන්න.
(ලකුණු 05 යි)

iv. කාර්මික විප්ලවයේ ප්‍රතිඵල ලෙස ආර්ථික, සමාජ හා දේශපාලන ක්ෂේත්‍රවල ඇතිවූ වෙනස්කම් කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න.
(ලකුණු 06 යි)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

Grade - 10

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)
Final Term Test - 2023 (2024)

33 | S | II

# ඉතිහාසය, வரலாறு, History - II


විභාග අංකය / சுட்டெண் / Index No. ..........................................

(i)




අනෙක් පිටුව බලන්න/ மறுபக்கம் பார்க்க/ See next page

(ii)




LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න